// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2120/6 - 2019 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා - 2019.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(X) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී.එල්.24 දරන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2018 අප්‍රේල් මස 19 වැනි දින අංක 2067/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට, යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

***කොන්දේසි***

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අධ්‍යයන පොදු සහතික උසස් පෙළ විභාගයේ ජීව විද්‍යා විෂයය ධාරාව යටතේ 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ජෛව තාක්ෂණ) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

05 - 82

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.